**වෘත්තීය තාක්ෂණ විශ්වවිද්‍යාලය - 2019**
**-----------------------------------------**

## 1.1 මතය
**-------**

වෘත්තීය තාක්ෂණ විශ්වවිද්‍යාලයේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාල සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2008 අංක 31 දරන වෘත්තීය තාක්ෂණ විශ්වවිද්‍යාල පනතේ 47(2) වගන්තිය සහ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

විශ්වවිද්‍යාලයේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිති වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 1.2 මතය සඳහා පදනම
**-----------------------**

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාර්ශවයන්ගේ වගකීම්
**------------------------------------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, වෘත්තීය තාක්ෂණ විශ්වවිද්‍යාලය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය වෘත්තීය තාක්ෂණ විශ්වවිද්‍යාලය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා වෘත්තීය තාක්ෂණ විශ්වවිද්‍යාලය අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

වෘත්තීය තාක්ෂණ විශ්වවිද්‍යාලයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, වෘත්තීය තාක්ෂණ විශ්වවිද්‍යාලයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යාම අවශ්‍ය කෙරේ.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

---

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බව අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදි. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නාවූ අවදානම් මඟහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබාගැනීම මාගේ මතයට පදනම් වේ. වරදක් නිසා සිදුවන බලපෑමට වඩා වංචාවක් හේතුවෙන් සිදුකරන ලද ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයක් හඳුනා නොගැනීම මගින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස වෘත්තීය තාක්ෂණ විශ්වවිද්‍යාලයේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය සහ යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල හා සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල සාධාරණත්වය ඇගයීම.
- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් වෘත්තීය තාක්ෂණ විශ්වවිද්‍යාලයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා වෘත්තීය තාක්ෂණ විශ්වවිද්‍යාලයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදි. ප්‍රමාණවත් අවිනිශ්චිතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතු වේ. මාගේ නිගමනයන් විගණකගේ වාර්තාවේ දිනය දක්වා ලබා ගන්නා ලද විගණන සාක්ෂි මත පදනම් වේ. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් විය හැකිය.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගයීම.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ වෘත්තීය තාක්ෂණ විශ්වවිද්‍යාලයේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්,

වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ වෘත්තීය තාක්ෂණ විශ්වවිද්‍යාලයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, විශ්වවිද්‍යාලය ක්‍රියාකර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන

-----------------

### 1.5.1 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පිළිබඳ අභ්‍යන්තර පාලනය

---------------------------------------------------------

ගනුදෙනු කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරීබලය සහිතව ක්‍රියාත්මක කිරීම, අදාළ වන වාර්තාකරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට අවශ්‍ය වන පරිදි ගනුදෙනු සටහන් කිරීම සහ වත්කම් සඳහා ගිණුම් කටයුතුභාවය පවත්වාගෙන යාම, කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරී බලය සහිතව පමණක් වත්කම්වලට ප්‍රවේශ වීම, සටහන් කරන ලද වත්කම් සඳහා වූ ගිණුම්කටයුතුභාවය පවත්නා වත්කම් සමඟ සාධාරණ කාල වකවානුවලදී සැසඳීම සහ වෙනස්කම් ඇතොත් ඒවා සම්බන්ධයෙන් නිසි පියවර ගැනීම ආදිය සඳහා සාධාරණ තහවුරුවක් ලබාගැනීමට ප්‍රමාණවත් “මනාලෙස සැලසුම් කරන ලද” අභ්‍යන්තර ගිණුම්කරණ පාලන පද්ධතියක් ආයතනය විසින් පවත්වාගෙන යාම අවශ්‍ය වේ.

## 2. මූල්‍ය සමාලෝචනය

--------------------

## 2.1 මූල්‍ය ප්‍රතිඵල

-------------

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු. 25,112,634 ක ඌනතාවයක් වූ අතර ඊට ප්‍රතිරූපව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.10,632,874 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.35,745,508 ක පිරිහීමක් නිරීක්ෂණය විය. ඉකුත් වර්ෂයට සාපේක්ෂව පුනරාවර්තන ප්‍රදාන රු. 61,500,000 කින් වැඩි වී තිබුණද නිපුණතා ආංශික සංවර්ධන ප්‍රදාන රු. 26,407,134කින් අඩු වීමත්, සේවක පිරිවැය රු.75,920.245 කින් හා සේවා පිරිවැය රු. 18,878,206 කින් වැඩි වීම ඉහත මූල්‍ය ප්‍රතිඵලයේ පිරිහීමට ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| (අ) ශ්‍රී ලංකා ජාතික කාර්මික අධ්‍යාපන ආයතනයේ කාර්යමණ්ඩලය 2009 ඔක්තෝබර් 12 දින වෘත්තීය තාක්ෂණ විශ්වවිද්‍යාලයට අන්තර්ග්‍රහණය කිරීමේදී 2009 ජූලි 27 දිනැති කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අංක DMS/E4/47/2/280/1 දරන ලිපියට පටහැනිව නිලධාරීන් 10 දෙනෙකු දරන්නාට පුද්ගලික වන සේ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය II තනතුරේ පිහිටුවා තිබුණු අතර, එම නිලධාරීන්ගෙන් 6 දෙනෙකු මෙතෙක් එම තනතුර සඳහා අවශ්‍ය අවම සුදුසුකම් සම්පූර්ණ කර නොතිබුණි. එසේ තිබියදී වැටුප් විෂමතාවය ඉවත් කිරීම සඳහා වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාවේ අනුමැතියකින් තොරව පාලක මණ්ඩල තීරණයකට අනුව 2016 දෙසැම්බර් 05 දිනැති අංක 17/2016 දරන විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ චක්‍රලේඛයට අනුව 2016 ජනවාරි 01 දින සිට බලපැවැත්වෙන පරිදි ගෙවීම් කිරීමට කටයුතු කර තිබුණි. ඒ අනුව 2016 ජනවාරි සිට 2019 සැප්තැම්බර් දක්වා හිඟ වැටුප්, අතිරේක දීමනා, අධ්‍යයන දීමනා, පර්යේෂණ දීමනා හා සංග්‍රහ දීමනා ලෙස එකතුව රු. 5,638,012 ක් විශ්වවිද්‍යාලය විසින් ගෙවා තිබුණි. | ඔවුන් කරන ලද ඉල්ලීමක් පාදක කර ගනිමින්, ඔවුන්ට අදාල වැටුප් පරිමාණය කළමණාකරන සේවා දෙපාර්තමේන්තුවෙන් ලබා දෙනතුරු 93 වන පාලක මණ්ඩලය මගින් අදාල පරිවර්තනය සිදුකිරීමට අවසර ලබා දී ඇත. | තනතුරට අවශ්‍ය සුදුසුකම් සම්පූර්ණ කිරීමෙන් පසු නියමිත අනුමැතිය මත වැටුප් ගෙවීම කල යුතුය. |
| (ආ) 2014 ජනවාරි 22 දිනැති අංක DMS/1670 දරන මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශයේ ලිපිය මගින් විශ්වවිද්‍යාල විද්‍යායතන සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් අනුමත කාර්යමණ්ඩලයට ඇතුලත් නොවූ උපදේශකවරුන් 6 දෙනෙකු හා විගණකවරයෙකු පත්කර තිබුණි. එම | මෙම උපදේශකවරුන්ගේ සේවය කොන්ත්‍රාත් පදනම යටතේ ප්‍රසම්පාදන ක්‍රියාවලිය අනුගමනය කරමින් තෝරාගෙන ඇත. විශ්වවිද්‍යාල විද්‍යායතනයන් ද ඇතුළුව විශ්වවිද්‍යාලයේද අභ්‍යන්තර විගණන කටයුතු කිරීම සඳහා ජ්‍යෙෂ්ඨ සහකාර අභ්‍යන්තර විගණක තනතුර සඳහා කළමණාකරන සේවා | නව තනතුරු ඇති කිරීමට හා බඳවාගැනීම් සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ පූර්ව අනුමැතිය මත සිදුකළ යුතුය. |

| | | |
|---|---|---|
| නිලධාරීන්ට 2017 ජුනි මාසයේ සිට 2019 ජූලි මාසය දක්වා කොන්ත්‍රාත් කාලය දීර්ඝ කරමින් පත්වීම් ලබාදී එකතුව රු.9,903,309 ක උපදේශක ගාස්තු ගෙවා තිබුණි. | දෙපාර්තමේන්තුවෙන් අනුමැතිය නොලැබුණ බැවින්, අදාල කාර්යයන් ඉටු කර ගැනීම සඳහා කොන්ත්‍රාත් පදනම යටතේ අදාල සේවාවන් ලබා ගන්නා ලදි. | |

## 3.4 මානව සම්පත් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) අනුමත කාර්යමණ්ඩලය තුල නොමැති උපදේශක තනතුරු සඳහා පාලක මණ්ඩලයේ තීරණයක් මත කොන්ත්‍රාත් පදනමින් සමාලෝචිත වර්ෂය තුලදී අවස්ථා දෙකකදී නිලධාරීන් දෙදෙනෙකු බඳවාගෙන එකතුව රු. 2,726,253 ක් දීමනා ගෙවා තිබුණි. | වෘත්තීය තාක්ෂණ විශ්වවිද්‍යාලයේ අලුතින් ආරම්භ කිරීමට බලාපොරොත්තු වන පාඨමාලාවන්හි ඇතුලත් විය යුතු වන විෂය මාලාව පිළියෙල කිරීම, මෙම උපාධි පාඨමාලා ආරම්භ කිරීම, එම උපාධි පාඨමාලා ආරම්භ කල පසු අදාල විෂයයන් සඳහා දේශන පැවැත්වීම යන කටයුතු සඳහා එම විෂය ක්ෂේත්‍රයේ ප්‍රවීනයන්ගේ දැනුම උපයෝගී කර ගැනීමත් වඩා ඵලදායක හා ප්‍රයෝජනවත් විශේෂඥ සේවාවක් ලබා ගැනීමේ අරමුණින්, පාලක මණ්ඩල අනුමැතිය සහිතව මෙම අධ්‍යයන කාර්යමණ්ඩල සාමාජික දෙපලගේ, සේවය ලබා ගන්නා ලදී. | නව තනතුරු ඇති කිරීමට හා බඳවාගැනීම් සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ පූර්ව අනුමැතිය ලබාගත යුතුය. |
| (ආ) 2011 ජනවාරි 25 සිට 2012 ජූලි 31 දක්වා පශ්චාත් උපාධිය හැදෑරීම සඳහා වැටුප් සහිත විදේශ අධ්‍යයන නිවාඩු ලබාගෙන තිබූ සහකාර කථිකාචාර්යවරයෙකු අධ්‍යයන නිවාඩු කාලසීමාව අවසන් වීමෙන් පසුව සේවයට වාර්තා නොකිරීම නිසා ගිවිසුම කඩ කිරීම මත අයවිය යුතු රු. 1,553,825 ක් වූ බැඳුම්කර වටිනාකම අයකර ගැනීමට සමාලෝචිත වර්ෂය අවසානය දක්වාම කටයුතු කර නොතිබුණි. | විශ්වවිද්‍යාලයට අයවිය යුතු මුදල් සම්බන්ධයෙන් නීතිමය පියවර ගැනීම සඳහා නීතිපති දෙපාර්තමේන්තුව වෙත 2015.05.07 දිනැතිව යොමු කරන ලදී. 2020 අගෝස්තු 12 දිනැති නීතිපති දෙපාර්තමේන්තුවේ ලිපිය අනුව අදාල පැමිණිල්ල ගල්කිස්ස දිසා අධිකරණයට ඉදිරිපත් කිරීම සඳහා නීතිපති දෙපාර්තමේන්තුව විසින් 2020.08.12 දිනැති ලිපිය මඟින් විශ්වවිද්‍යාලය වෙත යොමු කොට ඇති අතර එම පැමිණිල්ල හා ඊට අදාල ලේඛන නීතිපති දෙපාර්තමේන්තුව විසින් නම් කර ඇති නීතිඥවරිය වෙත භාරදීමට කටයුතු කොට ඇත. | බැඳුම්කර වටිනාකම අයකර ගැනීමට කටයුතු කල යුතුය. |

**3.5** **ව්‍යාපෘති හෝ ප්‍රාග්ධන වැඩ ප්‍රමාදයන්**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | විශ්වවිද්‍යාලය සඳහා වැඩහලක්, නේවාසිකාගාරයක් හා ආපනශාලාවක් ඉදිකිරීමට 2017 ජනවාරි 03 දින පැවති අමාත්‍ය මණ්ඩලය මගින් රු.මිලියන 927.34 ක ප්‍රතිපාදන සඳහා අනුමැතිය ලැබී තිබුණි. 2018 හා 2019 වර්ෂයන්හිදී අයවැය මඟින් එකතුව රු. මිලියන 268 ක් වෙන් කර දී තිබූ අතර 2018 වර්ෂයේ දී රු. 23,600,993 ක් උපදේශන ගාස්තු ලෙස ගෙවා තිබුණද සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් ව්‍යාපෘතිය ආරම්භ කර නොතිබුණි. | විශ්වවිද්‍යාලයේ ඉදිකිරීම් සම්බන්ධයෙන් උපකුලපතිතුමා විසින් පත්කරන ලද උපකමිටුව ගොඩනැගිලි තුනෙහි අපේක්ෂිත කාර්යයන් සඳහා තනි ගොඩනැගිල්ලක් ඉදිකිරීමට ඉදිරිපත් කල නිර්දේශ හා උපකුලපතිතමාගේ අනුමැතිය මත නැවත කැබිනට් මණ්ඩල අනුමැතිය ලබා ගත යුතුව තිබුණි. අමාත්‍යාංශ හා ලේකම් අවස්ථා කීපයකදී මාරුවීම හේතුවෙන් හා කොරෝනා තත්වය හේතුවෙන් කැබිනට් මණ්ඩල අනුමැතිය ප්‍රමාද විය. | ප්‍රතිපාදිත මුදල් උපරිම කාර්යක්ෂමතාවයකින් හා ඵලදායීතාවයකින් යුතුව භාවිතා කල යුතුය. |
| (ආ) | 2011 අප්‍රේල් මාසයේදී අමාත්‍ය මණ්ඩලය මගින් අනුමැතිය ලබා දී තිබුණු වෘත්තීය තාක්ෂණ විශ්වවිද්‍යාලයේ බහුකාර්ය ශබ්දාගාර සංකීර්ණයක් හා දේශනශාලා සංකීර්ණයක් සහිත ගොඩනැගිල්ල ඉදිකිරීමට එම වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය අවසානය දක්වා භාණ්ඩාගාරයෙන් හා ආංශික නිපුණතා සංවර්ධන ව්‍යාපෘතිය මගින් රු. මිලියන 434.9 ක් වෙන් කර දී තිබුණි. සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් රු. මිලියන 304 ක් වියදම් කර තිබුණ ද ගිණුම් වර්ෂය අවසාන වන විටත් ශබ්දාගාරය භාවිතයට ගත හැකි තත්ත්වයට පත්කර ගැනීමට නොහැකි වී තිබුණි. | ශබ්දාගාර සංකීර්ණයෙහි ඉදිකිරීම් වැඩ කරගෙන යන අතරතුර අරමුදල් ලබා දීමේ ගැටළුවක් හේතුවෙන් නිපුණතා සංවර්ධන හා වෘත්තීය පුහුණු අමාත්‍යාංශයේ දැනුම් දීම අනුව ඉදිකිරීම් කටයුතු නතර කරන ලදී. මෙම ශබ්දාගාරය සඳහා දැනටමත් උපකරණ කොටසක් මිලදී ගැනීම හා ඉදිකිරීම් වලින් කොටසක් සිදුකර අවසන් බැවින්, එම දරන ලද වියදම්, ආයතනයේ අරමුණ සඳහා යොදා ගැනීම වෙනුවෙන් මෙම ශබ්දාගාරය භාවිතා කිරීමට හැකි තත්ත්වයට පත් කිරීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කර ඇත. | ශබ්දාගාරය භාවිතයට ගතහැකි තත්වයට පත්කර ගැනීමට කඩිනමින් කටයුතු කල යුතුය. |